අභ්‍යන්තර විභාග නිවේදනය

මගේ අංකය:- **PPSC/EX/1/1/4/2/2024**
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව
පළාත් සභා කාර්යාල සංකීර්ණය
කුරුණෑගල
**2024.02.01**

වයඹ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ

**වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයෙහි ජීව වෛද්‍ය ඉංජිනේරු II වන ශ්‍රේණියේ දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ විධායක නිලධාරී 11 වන ශ්‍රේණියේ ජීව වෛද්‍ය ඉංජිනේරු නිලධාරීන් සඳහා දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය **- 2024** මාර්තු මස කුරුණෑගල නගරයේදී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ජීව වෛද්‍ය ඉංජිනේරු සේවා ගණයේ 11 වන ශ්‍රේණියේ නිලධාරීන්ට මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා අයදුම් කළ හැක.

**02.** මෙම විභාගය සඳහා අයදුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රය මෙම නිවේදනය අවසානයේදී පළ කර ඇති අතර මෙහි **04** වන ඡේදයේ උපදෙස් පරිදි සකසා සම්පූර්ණ කල ස්වකීය අයදුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් **2024.02.22** දින හෝ එදිනට පෙර ලේකම් , වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය , කුරුණෑගල යන ලිපිනයට ලියා පදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් ඉදිරිපත් කරන ලියුම් කවරයේ වම් පස ඉහල කෙලවරේ විභාගයේ නම සඳහන් කල යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ඇත.

**03.** අයදුම්පත්‍ර **:-** ඒ **4** ප්‍රමාණයේ කඩදාසියක අයදුම්පත්‍රය තමා විසින් පිළියෙල කර ගත යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුවද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරෙන්ම පිරවිය යුතුය.

**04.** විභාග ගාස්තු:- පළමුවරට මෙම විභාගයට පෙනී සිටිමට කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එසේ වුවත් ඉන්පසු වාර වලදී, විභාගයට පෙනී සිටින්නේ නම් රු. **1200/-** ක් වයඹ පළාත් සභාවේ අංක **2003-**02-13 දරණ ආදායම් ශීර්ෂයට බැර වන පරිදි වයඹ පළාතේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවා ව.ප.ස.මු. **02** අකෘතියෙන් ලබාගත් රිසිට්පත තම අයදුම්පතෙහි නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කල යුතුය. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩදෙනු නොලැබේ. කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

**05.** අනන්‍යතාවය **:-** අපේක්ෂකයින් විභාග ශාලාව තුලදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතරින් කුමක් වුවත් භාරගනු ලැබේ.

- I පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
- II වලංගු විදේශ ගමන් බලපත්‍රය (පාස්පෝට් බලපත්‍රයක් )
- III වලංගු රියදුරු බලපත්‍රය

**06.** විභාග ප්‍රවේශපත්‍රය **:-** විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාල ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් සඳහා, ඔවුන් තම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති ලිපිනයට විභාග ප්‍රවේශ පත්‍රය යොමු කරනු ලැබේ. එලෙස විභාග ප්‍රවේශ

පත්‍රය නොලැබුණහොත් විභාගය පැවැත්වෙන දිනට  දින 03කට පෙර ඒ බව වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයෙන් විමසිය යුතුය.

**07.** අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශපත්‍ර යොමු කල වහාම ඒ බව  වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යාලීය වෙබ් අඩවියේ ( www.psc.nw.gov.lk ) පළකරන අතර ,ඒ බව අදාල දෙපාර්තමේන්තු වෙත ද ලිඛිතව දැනුම් දෙනු ලැබේ.දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් අදාල අයදුම්කරුවන්ව ඒ පිළිබඳව දැනුවත් කළ යුතුය.

**08.** විභාගය සඳහා ප්‍රවේශ පත්‍ර ලැබූ, පළමුවතාවට විභාගයට පෙනී සිටින නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතු අතර ගමන් ගාස්තු නොගෙවිය යුතුය.

**09.** අපේක්ෂකයින් අදාල සේවයට ඇතුලත්වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් ප්‍රශ්න පත්‍ර වලට පිළිතුරු සැපයිය යුතුය.  තරඟ විභාගයක් නොමැතිව සේවයට බැඳුණු නිලධරයන් තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු සැපයිය යුතුය.

**10.** විභාග පරිපාටිය :-

| අනු අංක | විෂයය | කාලය | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 1 | විෂයානුබද්ධ දැනුම | පැය 02 | 100 | 40% |

විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 1. විෂයානුබද්ධ දැනුම | වෛද්‍ය උපකරණ මිළදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන කටයුතු,තාක්ෂණික ඇගයීම් කටයුතු කිරීම ද , වෛද්‍ය උපකරණ කළමණාකරණය,සේවා හා නඩත්තු කිරීම සහ ඊට අදාළ පුහුණු කටයුතු පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය හා එකී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ආදී වූ ජීව වෛද්‍ය ඉංජිනේරු ක්ෂේත්‍රයට අදාළ කටයුතු පිළිබඳ වේ. |

**11.** විභාගය සඳහා වන ප්‍රශ්න  පත්‍රයේ ස්වභාවය  :- රචනා ශෛලියේ ප්‍රශ්න පත්‍රයක් සැකසේ.

**12.** මෙම විභාග නිවේදනයේ විධි විධාන සලසා නොමැති කවර කරුණක් පිළිබද වුවද ඒ සම්බන්ධයෙන් වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විමසා වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් තීරණය කරනු ලැබේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි.

ඊ.එම්.පී.ඒකනායක,
ලේකම්,
වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

**අයදුම්පත්‍රය**

**<u>වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ විධායක සේවා ගණයෙහි ජීව වෛද්‍ය ඉංජිනේරු II වන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2024</u>**

**01.1.1** මුලකුරු සමඟ නම (සිංහලෙන්) :- ....................................................................
මයා/මිය/මෙනවිය

**1.2** මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන්): - ....................................................................

**1.3** මුලකුරු වලින් හැඳින්වෙන නම (සිංහලෙන්) :- ....................................................................
....................................................................................................

**1.4** විද්‍යුත් තැපැල් ලිපිනය(E-mail) :- ....................................................................
....................................................................................................

**1.5.** ජාතික හැඳුනුම්පත් අංක :-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

**1.6** උපන් දිනය -: අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

**02.** සේවා ස්ථානය හා ලිපිනය :-

**2.1.**කාර්යාලයේ /දෙපාර්තමේන්තුවේ /ආයතනයේ නම :- ....................................................................
....................................................................................................

**2. 2** රාජකාරි ලිපිනය:- ....................................................................
....................................................................................................

**2.3** දුරකතන අංකය :- රාජකාරී : ....................................................................
පෞද්ගලික : ....................................................................

**03.** දැනට දරන තනතුර :-

**3.1** තනතුර :- ....................................................................

**3.2** ශ්‍රේණිය :-....................................................................

**3.3** ඉහත ශ්‍රේණියට පත් වූ දිනය:- ....................................................................

**04.** ඔබ විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යය :- ☐
(සිංහල -S ,දෙමළ -T ,ඉංග්‍රීසි -E )
(අදාළ අක්ෂරය කොටුව තුල ලියන්න)

**05.** ඔබ විභාගයට ඉල්ලුම් කරන විෂයයන් (ප්‍රශ්න පත්‍රයේ නම සඳහන් කරන්න.)

**I.** ....................................................................

**06.** ඔබ මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවටද ? ....................................

**6.1** එසේ නොවන්නේ නම් විභාග ගාස්තු ගෙවා ලබාගත් (අලවා ඇති) කුවිතාන්සියේ,
කුවිතාන්සි අංකය :- ............................................ මුදල :- ...............
දිනය :- ..................................
නිකුත් කල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :- ..........................................

| කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

**07. අයදුම්කරුගේ සහතිකය :-**

**ඉහත සඳහන් විස්තර නිවැරදි බවත් ,ඉහත 4 ඡේදයේ දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි.මෙම විභාගය සඳහා පනවා ඇති නීති රීති පිළිපැදීමට ද එකඟ වන අතර මා වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරිනියක බවද සහතික කරමි.**

**(අදාළ නොවන වචන කපා හරින්න)**

.......................................................

අයදුම්කරුගේ අත්සන

**දිනය: .................**

**.08 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

- **I.** ඉහත විස්තර සඳහන් ...................................................................නැමැති මෙම අපේක්ෂකයා/අපේක්ෂිකාව මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්තව සිටින වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ නිලධාරියෙකු / නිලධාරිනියක බවද,
- **II.** ඔහු / ඇය ජීව වෛද්‍ය ඉංජිනේරු II ශ්‍රේණියේ නිලධාරියෙකු බවද, මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් සපුරා ඇති බවද,
- **III.** මෙම විභාගයට පෙනී සිටින්නේ පළමු වතාවට බවද / පළමු වතාවට නොවන බවද,නියමිත පරිදි විභාග ගාස්තු ගෙවා ඇති/නැති බවද,
- **IV.** අයදුම්කර ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම ඇති බවද,
- **V.** ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවද,

**සහතික කරමි.**

**(අදාළ නොවන වචන කපා හරින්න)**

..................................................

ආයතන / දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ

අත්සන හා නිල මුද්‍රාව

පදවි නාමය :.....................................................

ලිපිනය :..................................................

දිනය :..................................................